## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - 2013

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ 25 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදී රු.2,700,531 ක් අඩුවෙන් ගණනය කිරීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා වියදම හා වෙන්කිරීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සකස් කරන ලද සැලැස්ම සඳහා රු.2,686,068 ක් වැය කර තිබූ නමුත් එහි ඉදිකිරීම් කටයුතු සිදු කර නොතිබියදීත් එම වියදම ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර 2012 හා 2013 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.134,303 ක් හා රු.127,588 ක් ක්ෂය කර තිබුණි.

(ඇ) සේවකයන්ගෙන් අයවිය යුතු දුරකථන ගාස්තු රු.550,704 ක් හා වැටුප් රහිත නිවාඩු සඳහා අයවිය යුතු රු.372,531 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඈ) ප්‍රදානයන් ලෙස ලැබී තිබූ වාහන 35 ක වටිනාකම වූ රු.11,468,250 ක් ගිණුම්වලින් අත්හැරී තිබූ අතර රු.2,385,840 ක් වූ වාහන 04 ක වටිනාකම දෙවරක් ගිණුම් ගත වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළව වාහන සඳහා ගෙවිය යුතු රු.598,620 ක් වූ බලපත්‍ර ගාස්තු හා රු.622,500 ක් වූ අර්ධ සුබෝපභෝගී ද්විත්ව කාර්ය බදු වෙනුවෙන් ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ඊ) ගොඩනැගිලි හා පරිශ්‍රය නඩත්තු කිරීම සඳහා වැය කරන ලද රු.4,570,604 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(උ) ස්ථාවර වත්කම් ඉවත්කිරීමෙන් වූ ශුද්ධ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කර අදාළ ගිණුම්වල ගැලපීම් කිරීම වෙනුවට ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබුණු සම්පූර්ණ මුදලම ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම අධිකාරිය විසින් දිගින් දිගටම අනුගමනය කළ ප්‍රතිපත්තිය විය. සමාලෝචිත වර්ෂයේදී මෙසේ විකිණීමෙන් ලද මුදල රු.2,296,834 ක් වූ අතර 2003 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ලද මුදල රු.7,420,200 ක් විය.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රු.2,034,812 ක් වූ සේවක පුහුණු වියදම්වලට අදාළ ලිපි ගොනු විගණනයට ඉදිරිපත් නොකළ බැවින් එම වියදම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ රු.37,587,039 ක් වූ ණයගැති ශේෂයෙන් රු.11,710,229 ක් වූ ශේෂ වර්ෂ 05 ක් ද, රු.6,903,437 ක් වූ ශේෂ වර්ෂ 10 ක්ද, රු.3,468,087 ක් වූ ශේෂ වර්ෂ 1 සිට 4 ක කාල පරාසයක් ද අයනොවී පැවතුණි.

(ii) 2012 වර්ෂයේ සිට අයවිය යුතුව තිබූ පාඨමාලා ගාස්තු රු.3,955,000 ක් 2014 අගෝස්තු වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) සේවයෙන් ඉවත්වී ඇති සේවකයන් 86 දෙනෙකුගෙන් අයවිය යුතු උත්සව අත්තිකාරම් රු.215,800 ක් අයකර ගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ ණයහිමියෝ සහ ගෙවිය යුතු ශේෂවල එකතුව රු.82,314,599 ක් වූ අතර ඉන් රු.1,663,424 ක් වර්ෂ 05 ක් ද, රු. 1,994,480 ක් වර්ෂ 03 සිට වර්ෂ 05 ක කාලයක් සහ රු.21,135,144 ක් වූ ශේෂ වර්ෂ 01 සිට 02 ක කාලයක් පියවීමට කටයුතු නොකර පැවතුණි.

(ii) විවිධ කාර්යන් ඉටු කිරීම සඳහා බාහිර ආයතනවලින් ලැබී තිබූ අත්තිකාරම් මුදල් වලින් වියදම් දැරීමෙන් අනතුරුව ඉතිරිවන මුදල එම ආයතන වෙත ප්‍රතිපූර්ණය කළයුතු නමුත් සංචාරක ප්‍රවර්ධන ආයතනය, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හා අපනයන සංවර්ධන මණ්ඩලයට ප්‍රතිපූර්ණය කළයුතු රු.11,427,342 ක් දීර්ඝ කාලයක සිට ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2011 වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වෙනුවෙන් වූ රු.2,193,156 ක ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි.

(iv) 2009 සිට 2011 වර්ෂය දක්වා වූ රු.505,284 ක ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු හා රු.9,815,130 ක් වූ රඳවාගත් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි.

**2.4 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කලමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම |
| --- | --- | --- | --- |
| **(අ)** | **1971 අංක 38 දරන මුදල් පනත** | | |
| | (i) | 13(5)(ඩී) වගන්තිය | අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා 2014 ජූලි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) | 13.8 වගන්තිය | 2012 වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණන වාර්තාව පාලක මණ්ඩලය විසින් සලකා බැලීමෙන් පසුව යෝජිත පියවරයන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| | (i) | VIII පරිච්ඡේදයේ 6.1 වගන්තිය | පැයකට ගෙවිය යුතු අතිකාල දීමනාව දිනක වැටුපෙන් 1/8 ක් හෝ මාසික වැටුප් ලබන නිලධාරියෙකුගේ මාසික වැටුපෙන් 1/30 දිනක වැටුප ලෙස ගණන් බැලිය යුතු වුවත් අධිකාරිය දිනක වැටුප මාසික වැටුපෙන් 1/20 ක් ලෙස ගණන් බලා අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| | (ii) | IX පරිච්ඡේදයේ 2.2 වගන්තිය | කාර්යාල වේලාවෙන් පසුව කරන ලද රාජකාරි වෙනුවෙන් ලබන දීමනා වලින් සියයට 10 ක් වූ රාජ්‍ය භාගය අයකර ආදායමට ගත යුතු වුවත් අර්ධ කාලීන පාඨමාලාවල දේශන ගාස්තු හා අනෙකුත් දීමනාවලදී එලෙස අයකර නොතිබුණි. |
| | (iii) | XIV වැනි පරිච්ඡේදයේ 28.5 හා 28.6 වගන්ති. | ගමන් වියදම් ඉල්ලුම් පත්‍ර ප්‍රමාදවී ඉදිරිපත් කර තිබුණු අවස්ථාවලදී ආයතන සංග්‍රහය ප්‍රකාරව අඩු කිරීම් නොකර මුළු මුදලම ගෙවා තිබුණි. |
| | (iv) | XXIV පරිච්ඡේදයේ 3.17.4 වගන්තිය | ඇපකරුවකුගේ සේවය යම් හේතුවක් මත අවසන් කරනු ලැබුවහොත් වෙනත් පිළිගත හැකි ඇපකරුවකු මාසයක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවත් එලෙස කටයුතු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. |

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 110 හා 104 | හානි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී සිදු වූ වාහන අනතුරු 14 ක් හා ඉකුත් වර්ෂවලදී සිදු වී තිබුණු අනතුරු පිළිබඳව අලාභ හානි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 188 (2) | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් හා මුදල් ඇනවුම් බැර වූ බවට දන්වා නොමැති විට ඒ සම්බන්ධයෙන් විමර්ශනය කළ යුතු වුවත් වටිනාකම රු.429,055 ක් වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 210 හා 217 | ගෙවීම් නොසැලකිලිමත්ව ප්‍රමාද කිරීම් හේතුවෙන් ගෙවීමට සිදුවන ගාස්තු අදාළ නිලධාරියාගෙන් අයකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br>උදා:- ආදායම් බලපත්‍ර ලබා ගැනීම, වරිපනම් ගෙවීම |
| (iv) | මුදල් රෙගුලාසි 344 | මුදල් ලැබීම් වෙනුවෙන් නිකුත් කරනු ලබන ලදු පොත් ආයතනයට ලැබීමේදී මෙන්ම, නිලධාරීන් වෙත නිකුත් කිරීමේදී ද, උප පත්‍රිකා පොත් ලේඛනයක සටහන් කර අනුක්‍රමික අංක පිළිවෙලට නිකුත් කළ යුතු වුවත් අධිකාරිය උපදේශකවරුන්ට උප පත්‍රිකා පොත් නිකුත් කිරීමේදී ද එවැනි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 372 | නිලධාරීන්ට ලබා දෙන අග්‍රිමය හෝ අතුරු අග්‍රිමය වගකිව යුතු නිලධාරියෙකු විසින් මාසයකට එක් වරකට නොඅඩු වනසේ පරීක්ෂා කළ යුතු වුවත් එලෙස අතුරු අග්‍රිම ලබාදුන් දින සිටම අධීක්ෂණයට භාජනය නොකළ අවස්ථා අටක් මෙන්ම සුළු මුදල් අග්‍රිම සඳහා සුළු මුදල් ලේඛනයක් හෝ නඩත්තු කර නොතිබූ අවස්ථා 06 ක් විය. |
| (vi) | මුදල් රෙගුලාසි 381 | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පෞද්ගලික වාණිජ බැංකුවක ගිණුම් 02 ක් හා රාජ්‍ය බැංකුවක ගිණුමක් ආරම්භ කර තිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 1647(ඉ) | ආයතනය සතු වාහන භාරදුන් අය පිළිබඳ විස්තර හා භාරදුන් අයිතම පිළිබඳ විස්තරයක් ඇතුළත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ඇ)** | **2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| | (i) 9.3.1 වගන්තිය | අලුත්වැඩියා වටිනාකම රු.200,000 කට වැඩිවන විට රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ඒ අනුව කටයුතු නොකළ අවස්ථා 06 ක දී රු.1,462,641 ක් ගෙවා තිබුණි. |
| | (ii) 2.8, 2.12 හා 2.14.1 වගන්ති | වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරන්නේ නම් මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීම මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා හෝ ප්‍රසම්පාදන කමිටු වාර්තා හෝ ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඉ)** | **2004 ජනවාරි 28 දිනැති ටීවීඊටී (TVET)/1/වාලේ/2004/01 දරන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය** | |
| | (i) 1.2 වගන්තිය | පාඨමාලා සඳහා මුළු ධාරිතාවයෙන් සියයට 70 ක් නොමැතිව පාඨමාලා ආරම්භ නොකළ යුතු වුවත්, එකී ධාරිතාවය සපුරා නොමැතිව පාඨමාලා 492 ක් ආරම්භ කර තිබුණි. |
| | (ii) 1.1 වගන්තිය | පුහුණු පාඨමාලා අවසන් වන විට අවම වශයෙන් ධාරිතාවයෙන් සියයට 70 ක් පාඨමාලා සම්පූර්ණ කළ යුතු වුවත්, එලෙස නොවූ පාඨමාලා 173 ක් විය. |
| **(ඊ)** | **1989 මාර්තු මස 23 දිනැති අංක 19/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 හා 06 ඡේද** | අතිකාල වැඩ සඳහා ලේඛණයක් නොවූ අතර වැඩ අවසන් කළ බවට සෑහීමකට පත්වීමෙන් පසුව මාණ්ඩලික නිලධාරියා විසින් අතිකාල ගෙවීමට අදාළ වවුචර් සහතික කළ යුතු වුවත්, එලෙස සිදු නොකළ අවස්ථා 39 ක් විය. |
| **(උ)** | **1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | සෑම මාස 06 කට වරක්ම වාහනවල ඉන්ධන දැවීම පිළිබඳව පරීක්ෂාකළ යුතු වුවත්, සියළුම වාහන සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |
| **(ඌ)** | **2007 මැයි 11 දිනැති අංක 9/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය** | චක්‍රලේඛයේ විධි විධානවලට පටහැනිව සේවකයන් දෙදෙනෙකු බඳවාගෙන ඔවුන්ට වැටුප් වශයෙන් රු.1,253,000 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| **(එ)** | **1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5 (1) වගන්තිය** | සේවය අවසන් කරන ලද සේවකයන්ට දින 30 ක් ඇතුළත පාරිතෝෂික මුදල් ගෙවිය යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකළ අවස්ථා 35 ක් විය. ප්‍රමාද කාලය මාස 01 සිට මාස 26 ක් දක්වා විය. |
| **(ඒ)** | **2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| | (i) 6.5.1 වගන්තිය | ගිණුම් සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) 7.4.1 වගන්තිය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් මාස 03 කට වරක් රැස්විය යුතු අතර එහිදී සාකච්ඡා කළ යුතු කරුණු 09 හි ඇතුළත් විගණකාධිපති වාර්තා හා විගණන විමසුම් සාකච්ඡාවට භාජනය කළ යුතු වාර්තා 162 ක් හා අභ්‍යන්තර විගණන වාර්තා 70 ක් සාකාච්ඡා කර නොතිබුණි. |
| | (iii) 7.4.5 වගන්තිය | වාර්ෂික ස්ථාවර වත්කම් සමීක්ෂණයක් පැවැත්විය යුතු අතර එය ස්ථාවර වත්කම් ලේඛනයේ ශේෂයන් සමඟ සැසඳිය යුතු වුවත්, එලෙස සිදුකර නොතිබුණි. |
| | (iv) 8.3.9. හා 9.4 වගන්ති | චක්‍රලේඛයේ විධි විධානවලට පටහැනිව සේවකයන් 22 දෙදෙනෙකු අමාත්‍යාංශයට හා වෙනත් රාජ්‍ය ආයතනවලට මුදාහැර වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| | (v) 9.3.1 ( vii) වගන්තිය | යම් හේතුවක් මත වැඩ බැලීමේ පත්වීම් සිදු කළද එය මාස 03 ක් ඉක්මවා ලබා නොදිය යුතු වුවත්, ඊට පටහැනිව කටයුතු කළ අවස්ථා 15 ක් විය. |
| **(ඔ)** | **2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | චක්‍රලේඛයේ විධි විධානවලට පටහැනිව අධිකාරියේ නිලධාරීන්ට දුරකථන සඳහා රු.2,211,090 ක් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.49,225,894 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.16,030,860 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.65,256,754 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. එයට රජයේ හා විශේෂ ව්‍යාපෘති ප්‍රදාන, අනෙකුත් ප්‍රදාන, විවිධ ආදායම් හා නිෂ්පාදන ඒකක ලාභ අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2** **ආයතනයට එරෙහිව පවතින හා ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

සේවකයන් විසින් ආයතනයට එරෙහිව නඩු 06 ක් ද, බාහිර ආයතන විසින් නඩු 02 ක්ද පවරා තිබුණි. සේවකයන් දෙදෙනෙකු විසින් පවරන ලද නඩුවකට සේවකයන්ට වාසි සහගතව 2007 තීන්දුව ලබාදී තිබූ නමුත් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් නොතකා එයට එරෙහිව අධිකාරිය විසින් ඇපෑලක් ඉදිරිපත් කර තිබුණු අතර නැවත එම තීන්දුව ප්‍රකාශයට පත්කර රු.5,469,015 ක් වැටුප් හා දීමනා ලබා දෙන ලෙසත් සේවකයන් දෙදෙනා නැවත සේවයේ පිහිටුවීමටත් සිදුවී තිබුණි. තවද සේවය දීර්ඝ නොකිරීම මත පවරන ලද නඩුවකට වර්ෂ දෙකක වැටුප වූ රු.455,520 ක් හා තවත් සේවකයකුට රු.87,000 ක් ගෙවා තිබුණි. මෙම නඩු සඳහා රු.1,329,741 ක් නීතිඥ ගාස්තු ලෙස ගෙවා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දී ක්ෂේත්‍ර 18 ක් තුළ පාඨමාලා 77 කට ආධුනිකයින් 33,882 ක් බඳවා ගැනීමට අපේක්ෂා කළද බඳවා ගෙන තිබුණේ ආධුනිකයින් 28,446 ක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීම සහ ජාතික වෘත්තිය සුදුසුකම් සහතිකපත්‍ර ලබාදීම පිළිබඳ ඇස්තමේන්තුගත තත්ත්වයන් හා තථ්‍ය කාර්යසාධනය අතර පිළිවෙලින් සියයට 16 කින් හා සියයට 30 කින් ඉටුකර ගෙන නොතිබුණි.

(ඇ) වාර්ෂිකව පාඨමාලා හැරයන සංඛ්‍යාව සැලකිය යුතු අගයක් ගෙන තිබුණු අතර එම සංඛ්‍යාව අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2013 මුල් අර්ධ වර්ෂයේ පාඨමාලාවලට බඳවාගන්නා ලද ආධුනිකයින් අතරින් 783 ක් පාඨමාලා හැර ගොස් තිබුණු අතර 2013 වර්ෂය අවසානය වන විට එම සංඛ්‍යාව 2,986 ක් වී තිබුණි.

(ඈ) ආධුනිකයින් 16,800 ක් වැඩිදුර පුහුණුව සඳහා යොමු කිරීමට සැලසුම් කර තිබුණද තථ්‍ය ලෙසම වැඩිදුර පුහුණුව සඳහා යොමුකර තිබුණේ පුහුණුලාභීන් 10,214 ක් පමණි.

(ඉ) ආධුනිකයින් 8,025 ක් රැකියාගත කිරීමට ඉලක්ක කර තිබුණද රැකියා සඳහා යොමුකර තිබුණේ 4,974 දෙනෙකු පමණි.

(ඊ) පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් ක්ෂේත්‍ර 06 ක් යටතේ කාර්යයන් 29 ක් සැලැසුම් කර තිබුණද සිදුකර තිබුණේ කාර්යය 17 ක් පමණි. සමාලෝචිත වර්ෂය තුළ නව පාඨමාලා ව්‍යාපෘති යෝජනා හා ව්‍යාපෘති අධ්‍යයනයන් එක බැගින් කිරීමට අපේක්ෂා කළද ඒවා සිදුකර නොතිබුණි. පර්යේෂණ සියයට 80 කින්ද, ව්‍යාපෘති සහරා සියයට 50 කින් හා ක්‍රියාමූලා පර්යේෂණ සියයට 24 කින්ද අපේක්ෂිත ඉලක්ක ඉටු කරගෙන නොතිබුණි.

**(උ) ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සම්බන්ධ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

(i) "ඔබේ ව්‍යාපාරය දැනගන්න වැඩසටහන" යටතේ වැඩසටහන් 20 ක් පවත්වා 300 දෙනෙකු සහභාගී කර ගැනීමට අපේක්ෂා කළද පවත්වා තිබුණු වැඩසටහන් සංඛ්‍යාව දක්වා නොතිබුණු අතර 155 දෙනෙකු සහභාගී වී තිබුණි.

(ii) පුහුණුලාභී ආධුනිකයින් 200 ක් සඳහා මූල්‍ය පහසුකම් සපයා දීමට ඉලක්ක කර තිබුණද මූල්‍ය පහසුකම් සපයා තිබුණේ ආධුනිකයින් 149 දෙනෙකු සඳහා පමණි.

(ඌ) දැනටමත් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට තමන්ගේ දැනුම හා කුසලතාවය වර්ධනය කර ගැනීමට හා වෙනස්වන ලෝකයේ නව තාක්ෂණික දැනුම ලබාදීම අරමුණු කර ගෙන වැඩ සටහන් 40 ක් පවත්වා 3,050 දෙනෙකු සහභාගී කර ගැනීමට අපේක්ෂා කළද පවත්වා තිබුණේ වැඩසටහන් 31 ක් වන අතර ඊට සහභාගීවී තිබුණේ 2,434 දෙනෙකු පමණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අධිකාරියට අයත් කැබ් රථයක් 2003 වර්ෂයේ අනතුරට ලක්වී තිබූ අතර අනතුර සම්බන්ධව පරීක්ෂා කිරීමට කමිටුවක් පත්කර තිබුණේ වර්ෂ 06 කට පසුව 2009 පෙබරවාරි මාසයේදීය. රියදුරුගෙන් රු.185,333 ක්ද තවත් නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.235,667 ක් හා වාහනයේ රු.135,000 ක් වටිනා අමතර කොටස් නැතිවීම සම්බන්ධයෙන් වාහන භාරව සිටි නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලෙස පරීක්ෂණ කමිටුව නිර්දේශ කර තිබුණද, ඒ අලාභය අයකිරීමට ක්‍රියාමාර්ගයක් 2014 අගෝස්තු මාසය දක්වාම සිදුකර නොතිබුණු අතර භෞතික පරීක්ෂාවේදී එම වාහනය අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ නොතිබූ බැවින් වටිනාකමක් නොමැති මෙම වාහනය ස්ථාවර වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අත්තිකාරම් ලබාගෙන එම කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් අවස්ථා 26 කදී රු.2,597,010 ක් වූ අත්තිකාරම් පියවීමට දින 60 සිට දින 178 ක් ගතවී තිබූ අතර වාර්ෂික වාහන බලපත්‍ර ලබාගැනීමට ගත් අත්තිකාරම්වලින් වාහන 55 ක් සඳහාම නියමිත දිනට බලපත්‍ර ලබා නොගැනීම නිසා රු.42,575 ක දඩ ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) **ටී ෂර්ට් මිලදී ගැනීම් පිළිබඳ පරීක්ෂාව**

ආධුනිකයින් සඳහා රු.6,322,442 ක් වැයකර ටී ෂර්ට් මිලදී ගැනීම සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ටී ෂර්ට් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 වගන්තිය ප්‍රකාරව සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ii) ඇණවුම් කළ ටී ෂර්ට් 25,000 න් අවස්ථා 10 කදී 10,412 ක් පමණක් සපයා තිබූ අතර ප්‍රමිතියකින් තොර හා ගුණාත්මක මට්ටමින් තොරවීම නිසා ටී ෂර්ට් 2,143 ක් ආපසු හරවා යවා තිබුණි.

(iii) නිවැරදිව හා යාවත්කාලීනව තොග වාර්තා පවත්වා නොතිබූ අතර පවත්නා තොරතුරු අනුව ටී ෂර්ට් 2,517 ක අතිරික්තයක් පැවති බව විගණනයේදී අනාවරණය විය.

(ඈ) දිස්ත්‍රික් කාර්යාලය මඟින් පුහුණු ද්‍රව්‍ය මිලදී ගැනීමේදී තථ්‍ය වශයෙන් සිටි ආධුනිකයින් සංඛ්‍යාවට අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය ප්‍රමාණයට වඩා රු.1,984,078 ක් වැඩියෙන් මිලට ගෙන තිබුණි. නිපුණතා හා නව නිර්මාණ තරඟයක් සඳහා අධිකාරිය විසින් රු.813,255 ක් වැය කර පුහුණු ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණු අතර ඒවා තොග ලේඛනවල නිවැරදිව ඇතුළත් කර නොතිබුණි.

(ඉ) පුත්තලම දිස්ත්‍රික්කයේ පැවති මධ්‍යස්ථාන 09 ක පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මධ්‍යස්ථාන දෙකක පාඨමාලා ක්‍රියාත්මක කර නොතිබුණු අතර සමස්ත පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය සියයට 8.81 ක් වුවද පාඨමාලා වෙන් වෙන්ව ගත්විට හැරයාමේ ප්‍රතිශතය සියයට 12 සිට සියයට 47 ක පරාසයක විය.

(ii) 2008 සිට 2012 දක්වා පවත්වන ලද පාඨමාලා 27 කට සහතික ලබාදී නොතිබූ අතර ඉහත පාඨමාලා හැර අනෙකුත් පාඨමාලා සඳහා ප්‍රධාන කාර්යාලයෙන් ලබාදී තිබූ සහතිකපත් 66 ක් බෙදා දී නොතිබුණි.

(iii) උපදේශකවරු තිදෙනෙකු ඉගැන්වීමේ කටයුතුවල නිරත නොවූ අතර පාඨමාලා 14 ක් ප්‍රතීතන මට්ටමක නොතිබුණි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලා සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් නොතිබීම හේතුවෙන් ප්‍රතීතන සහතිකය ලබා ගෙන නොතිබුණි.

**(ඊ) රියදුරු පුහුණු පාසල් පවත්වාගෙන යාම.**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) රියදුරු පාසල් 11 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර 2013 වර්ෂයේ ආධුනිකයින් 646 දෙනෙකු බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණද බඳවාගෙන තිබුණේ 86 ක් පමණි. ඉලක්කගත ප්‍රමාණයට වඩා 560 කින් හෙවත් සියයට 86.66 ක ප්‍රතිශතයකින් අඩු ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවාගෙන තිබුණි.

(ii) රියදුරු පාසල් 05 කට වාහන 14 ක් අනුයුක්ත කර තිබුණද ආධුනිකයින් බඳවාගෙන නොතිබුණි.

(iii) කෑගල්ල හා අම්පාර මධ්‍යස්ථානවලට උපදේශකයකු අනුයුක්ත කර තිබුණද පාඨමාලා පවත්වා නොතිබූ අතර අනුරාධපුර මධ්‍යස්ථානයට එක් ආධුනිකයෙකු පමණක් බඳවා ගෙන තිබුණි.

(iv) සැහැල්ලු වාහන සඳහා බලපත්‍ර පමණක් ලබාදුන්නද මධ්‍යස්ථානවලට අනුයුක්ත කළ බස් රථ හා මෝටර් බයිසිකල් නිෂ්ක්‍රීයව පැවතුණි.

**(උ) වාහන අනතුරු පිළිබඳ පරීක්ෂාව**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වාහන අනතුරු 04 කට අදාළ වන්දි මුදල් ලබාගෙන නොතිබුණි.

(ii) 2011 වර්ෂයේදී සිදුවූ වාහන අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණය 2014 ජුලි 30 දින වන විටත් සිදුකර නොතිබුණි. අනතුර සිදුවන අවස්ථාවේ වාහනය ධාවනය කර තිබුණේ කම්කරු කාර්යය මණ්ඩලයේ අයෙකු වන අතර ඔහු විසින් වරද පිළිගෙන තිබුණි. අනතුරේදී තෙවන පාර්ශවයට සිදුවූ රු.255,950 ක අලාභය ගෙවන ලෙස 2012 වර්ෂයේ එන්තරවාසියක් එවා තිබුණද ඒ සම්බන්ධයෙන් 2014 ජුලි 31 දින දක්වාම කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(ඌ) ජාතික වෘත්තීය පුහුණු ආයතනය - නාරාහේන්පිට**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පවත්වන ලද අර්ධ කාලීන පාඨමාලා 12 න් 10 ක් සඳහා අදාල අනුමැතිය ලබා ගැනීම, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව සත්‍ය වියදම් වාර්තාවක් ඉදිරිපත් කිරීම, පාඨමාලාව ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කල යුතු වාර්තා (SOT 05, SOT 02) ඉදිරිපත් කිරීම, මෙහෙයුම් වියදම් හා ලාභය ප්‍රධාන කාර්යාලයේ ගිණුමට බැර කිරීම හා මාස 06 කට වරක් වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රවාහන පහසුකම් හිමි නොවන නිලධාරියෙකු කාර්යාලයේ සිට නිවස දක්වා ගමන් කිරීම සඳහා අනුයුක්ත කර ඇති වාහනයට රු.12,100 ක අනුමත ඉන්ධනවලට අමතරව රු.62,246 ක ඉන්ධන ලබාගෙන තිබුණි.

**(එ)** රත්මලාන මධ්‍යස්ථානයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි භාණ්ඩ 165 ක් හා භාවිතයට ගත නොහැකි භාණ්ඩ 56 ක් අනාරක්ෂිතව ගබඩා කර තිබුණි.

**(ඒ) ලැබීම් හා ගෙවීම් - රත්මලාන ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය**

සුළු මුදල් පොතක් නඩත්තු නොකිරීම හා සුළු මුදල් ගෙවීම් වවුචර් පිළියෙල නොකිරීම, ආදායම් ලැබීම් සටහන් කිරීමට ලේඛනයක් නඩත්තු නොකිරීම, අවස්ථා 18 කදී රු.133,780 ක අත්තිකාරම් අත්තිකාරම් ලේඛණයේ සටහන් නොකිරීම, නිෂ්පාදන ඒකකයේ බැංකු ගිණුමේ රු. මිලියනයකට වැඩි මුදලක් සෑම මාසයකම නිෂ්කාර්යව තිබීම, 2012 දෙසැම්බර් මාසයේ ලැබුණු රු.75,700 ක ආදායම් 2013 ජනවාරි 01 දින මුදල් පොතේ සටහන් කිරීම, අනුක්‍රමික අංක පිළිවෙලට ලැබීම් ලදුපත් මුදල් පොතේ සටහන් නොකිරීම හා ලදුපත් අංක නොකිරීම වැනි අඩුපාඩු නිරීක්ෂණය වූ බැවින් මධ්‍යස්ථානයේ මූල්‍ය පාලනය දූර්වල තත්ත්වයක පවතින බව පෙන්නුම් කෙරුණි.

**(ඔ) අධ්‍යයන කටයුතු**

**(i) පුහුණු පාඨමාලා පැවැත්වීම**

(අ) ආධුනිකයින් බඳවා ගැනීමේදී හඳුන්වාදී ඇති ක්‍රමවේදය අනුගමනය නොකිරීම හේතුවෙන් පාඨමාලා හැරයන ආධුනිකයින්ගේ සංඛ්‍යාව සියයට 20 ඉක්මවූ පාඨමාලා සමාලෝචිත වර්ෂයේදී 296 ක් හා ඉකුත් වර්ෂයේදී පාඨමාලා 181 ක් විය.

(ආ) අර්ධ වාර්ෂිකව පවත්වන පාඨමාලා 165 ක් එක් අර්ධ වර්ෂයක පමණක් පවත්වා තිබුණි. ප්‍රමාණවත් ආධුනිකයින් සංඛ්‍යාවක් නොමැති හෝ නොපවත්වන ලද පාඨමාලාවලට අනුයුක්ත කර ඇති උපදේශකයන් මාස 02 ක් ඉක්මවා වැටුප් ලබාගන්නේ නම් වෙනත් මධ්‍යස්ථානවලට මාරු කිරීම හෝ එසේ නොවන්නේනම් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව නියමකර තිබුණද, එසේ සිදු නොකර උපදේශකයින් 233 ක් මධ්‍යස්ථානවල රඳවාගෙන තිබුණි.

(ඇ) පාඨමාලා සඳහා බඳවා ගත හැකි උපරිම ආධුනිකයින් සීමාව ඉක්මවා පාඨමාලා 787 ක් පවත්වා තිබුණු අතර ධාරිතාවය ඉක්මවීමේ පරාසය සියයට 40 සිට 500 ක ප්‍රතිශතයක් වූ අවස්ථා 129 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පාඨමාලා 205 කට ආධුනිකයින් 5,380 ක් බඳවා ගැනීමට ඉලක්ක කළද එම පාඨමාලා පවත්වා නොතිබුණි.

(ඉ) උපදේශක කාර්යය මණ්ඩලයේ 70 දෙනෙකු වැටුප් රහිත නිවාඩු දින 1,621ක් ලබාගෙන තිබූ අතර වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම පාඨමාලා හදාරන ආධුනිකයින්ගේ පුහුණු කටයුතුවලට අහිතකර බලපෑමක් සිදු කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ii) පාඨමාලා අවසානයේ විභාග පැවැත්වීම.**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 හා 2012 පලමු අර්ධ වර්ෂයේ ලියාපදිංචි වූ ආධුනිකයින් 45,759 දෙනාගෙන් 16,399 ක් පාඨමාලා සම්පූර්ණ කර තිබුණු ආධුනිකයින් සියලු දෙනාම පෙර ඇගයීමට ලක් කර නොතිබුණි.

(ආ) ප්‍රතිඵල නොලැබීම, පාඨමාලා ප්‍රතීතන මට්ටමක නොවීම හා වෙනත් හේතුන් මත සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් 2011 හා 2012 පළමු අර්ධ වර්ෂයේ පාඨමාලා 703 ක ලියාපදිංචි ආධුනිකයින් 8,048 කට සහතික පත්‍ර ලබාදී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පාඨමාලා සම්පූර්ණ කර ඇති ආධුනිකයින් 15,725 කට සහතික පත්‍ර ලබාදී තිබුණි.

**(ඕ) ඉදිකිරීම් සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.**

(i) අහංගම නව හෝටල් පාසලේ සැලැස්ම හා ප්‍රමාණපත් සැකසීමට 2011 වර්ෂයේ එළඹී රු.2,476,968ක ගිවිසුම අනුව මාස 02 ක් ඇතුළත එම කාර්යය නිමකර භාරදිය යුතු වුවත් කාර්යය නිම කර භාරදී තිබුණේ මාස 05 ක ප්‍රමාදයකින් පසුව වුවත් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. ප්‍රමාණපත් සකස් කර තිබුණු බවට තොරතුරු අනාවරණය නොවූ අතර 2014 අගෝස්තු මාසය වන විටත් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ii) තංගල්ල නව ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා අදාළ ඉඩමේ පස් පරීක්ෂණයට රු.268,393 ක් වැය කර ඇතත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

**(ක) කෙරීගෙන යන වැඩ**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මහනුවර දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ආපනශාලාව සහ පන්ති කාමරය ඉදිකිරීම් සම්බන්ධ කොන්ත්‍රාත්තුව සඳහා 2011 වර්ෂයේ වියදම් කරන ලද රු.1,528,035 ක් හා සමාලෝචිත වර්ෂයේ වැය කරන ලද රු.1,661,286 ක එකතුව වූ රු.3,189,321 ක් වර්ෂය අවසාන වන විටත් කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. නැවත මෙම කොන්ත්‍රාත්තුව වෙනත් කොන්ත්‍රාත්කරුවකුට 2013 නොවැම්බර් 20 දින ලබාදී අත්තිකාරම් ලෙස රු.1,661,286 ක් හා පළමු ගෙවීම ලෙස රු.1,156,800 ක් ගෙවා ඇතත් ගිවිසුම් ප්‍රකාරව දින 120 කින් නිම කිරීමට නියමිත වුවද 2014 නොවැම්බර් 7 දින වන විටත් මෙම කොන්ත්‍රාත්තුව නිම කර නොතිබුණි.

(ii) වවුනියාව දිස්ත්‍රික් කාර්යාලයේ ඉදිකිරීම් කටයුත්තක් සඳහා 2012 වර්ෂයේ සහකාර අධ්‍යක්ෂ විසින් රු.2,820,560 ක මුදලක් ලබාගෙන තිබූ අතර එම මුදල්වලින් කරන ලද ඉදිකිරීම් අනාවරණය නොවුණි.

(iii) මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ නව වැඩහල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.42,613,557 කට 2013 නොවැම්බර් 07 දින පිරිනමා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු දින 150 කින් නිමකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ග) රාජකාරි දුරකථන ගෙවීම් පරීක්ෂාව**

(i) චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව අනුමත රාජකාරී ජංගම හා නිවාස දුරකථන බිල්පත් නිරවුල් කිරීමට අතිරේකව ජංගම දුරකථනයක් ලබාදී නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් රු.55,727 ක බිල්පත අධිකාරිය විසින් ගෙවා තිබුණි.

(ii) චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව අධ්‍යක්ෂකවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන සහකාර අධ්‍යක්ෂකවරුන් හා දිස්ත්‍රික් කාර්යාලවල සහකාර අධ්‍යක්ෂකවරුන් සඳහා පමණක් අනුමත සීමාවන් යටතේ දුරකථන පහසුකම් හිමි වුවද අධිකාරිය විසින් 2013 මාර්තු මස සිට රාජකාරි දුරකථන හිමි නොවන නිලධාරීන් 421 දෙනෙකුට ජංගම දුරකථන සම්බන්ධතාව ලබාදීම සඳහා රු.2,155,363 ක වියදමක් කර තිබුණි. මේ සම්බන්ධයෙන් විගණනයේදී වරින්වර පෙන්නුම් කළද, ඒ සඳහා කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

(iii) 2009 ජුනි සිට දෙසැම්බර් දක්වා අනුමත දුරකථන සීමාව ඉක්මවූ නිලධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණු රු.91,576 ක් අයකර ගතයුතු නිලධාරීන් 11 දෙනෙකු සේවයෙන් ඉවත්ව තිබුණි.

**(ඝ)** අවස්ථා 04 කදී රු.782,092 ක් වටිනා වාහන සඳහා නව එන්ජින් සවිකිරීම ප්‍රාග්ධනිත කිරීමේදී සවිකළ වාහනය වෙනුවට වෙනත් වාහනයකට සවිකළ ලෙස ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර තිබුණි.

**(ඞ)** ඉකුත් වර්ෂයේ ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු.3,315,515 ක් 2014 වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. අර්ධ කාලීන පාඨමාලා හැරගිය ආධුනිකයින් 213 ක ගෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු.1,661,150 ක් වූ අතර චක්‍රලේඛ ප්‍රකාරව එම මුදල් උපදේශකවරුන්ගෙන් අයකළ යුතු වුවත් එලෙස සිදු නොකර පාඨමාලා හැරයාම් ලෙස කපා හැර තිබුණි.

**(ඳ)** වටිනාකම රු.20,696,800 ක් වූ වාහන 21 ක් සහ රජයට අයත් ඉඩම් 05 ක රු.34,184,361 ක් වියදම් කර ගොඩනැගිලි ඉදිකර තිබුණද එම වත්කම් අධිකාරිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3. මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ සුබසාධක සංගමය විසින් පවත්වන ලද සූර්යය උදානය 2013 වැඩසටහන සඳහා අනුග්‍රාහක දායකත්වය ලබාදීම සඳහා රු.300,000 ක් හා 2013 මැයි 01 දින පවත්වන ලද අධිකාරියේ අනාගත ගමන්මග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සංග්‍රහ කටයුතු සඳහා වැය කරන ලද රු.161,000 ක්

ප්‍රවර්ධන වියදම් යටතේ දක්වා තිබුණු අතර මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම වැඩසටහන එම දිනයේ පැවැත්වූයේද යන්න විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

**(ආ) වීටීජ් හෝල්ඩින්ස් සමාගම පිහිටුවීම**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වීටීජ් හෝල්ඩින්ස් සමාගම 2013 අගෝස්තු 13 දිනැති අංක 162/08 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත 2013 දෙසැම්බර් 18 දින සමාගම් පනත යටතේ සීමිත පෞද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි කර තිබුණි. මේ සඳහා 2014 ජුනි 10 දින යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණ නමුත් වාර්තාවේ දිනය දක්වාම මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි රජයට, අමාත්‍යාංශයට හෝ වෘත්තීය පුහුණු අධිකාරියට වැය බරක් හෝ සේවක වගකීමක් නොපැවරෙන පරිදි ස්වාධීනව පවත්වාගෙන යනු ලබන රජයේ විගණකාධිපතිවරයාගේ පරීක්ෂාවට ලක් කළ හැකි ආයතනයක් වශයෙන් ස්ථාපිත කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි. එහෙත් 2014 ජනවාරි 21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 167/06 මගින් වීටීජ් හෝල්ඩින්ස් ආයතනයට රු.මිලියන 2 ක් 2014 වර්ෂයේ පියවීමේ පදනම මත ලබාදුන්නද වාර්තාවේ දිනය දක්වාම පියවා නොතිබුණි. එමෙන්ම ආහාර සැපයුම් සේවා අංශය සඳහා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවකයින් දෙදෙනෙකුද, ප්‍රවාහන අළුත්වැඩියා හා නඩත්තු කටයුතු අංශයේ සේවකයින් 2 ක්ද, අධිකාරියෙන් වැටුප් ගෙවා සේවයේ යොදවා ගෙන තිබුණි. තවද ආධුනිකයින් 7 ක් පුහුණුව සඳහා අනුයුක්ත කර තිබුණු අතර ඔවුන්ගේ දීමනාවද අධිකාරිය විසින් ගෙවා තිබුණි.

(ඇ) 2011, 2012 හා 2013 වර්ෂයේදී සමීක්ෂණ මණ්ඩල පවත්වා හඳුනා ගන්නා ලද අතිරික්තතා හා ඌණතා පිළිබඳව ගිණුම්වල ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඈ) 2011 සිට 2013 දක්වා සේවයෙන් ඉවත් වූ සේවකයන් 11 දෙනෙකුට රු.1,649,992 ක පාරිතෝෂික ගෙවා නොතිබුණි.

## 4.4 සෙමින් චලනය වන නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පුත්තලම දිස්ත්‍රික් කාර්යාලයේ වටිනාකම රු.633,064 ක්වූ අයිතම 07 ක් හා වටිනාකම සඳහන් නොවූ අයිතම 05 ක්, පාඨමාලාවලට ප්‍රයෝජනයට නොගන්නා Food Server 10 ක් හා Guriton trolley 04 ක් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පවතුණි. තවද පරිගණක මොනිටර් 14 ක් හා මහන මැෂිමක් ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණු අතර වඩු කාර්මික පාඨමාලාවට යවන ලද උපකරණ 09 කට අදාළ අයිතම 73 ක් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) උපදේශකවරුන් නොමැතිවීම හේතුවෙන් පාඨමාලා 17 ක් ආරම්භ කර නොතිබුණු අතර එම පාඨමාලා සඳහා භාවිතා කරන ලද පුහුණු උපකරණ 679 ක් නිෂ්ක්‍රීයව පැවතුණි . ඉන් උපකරණ 11 ක වටිනාකම රු. 970,000 ක් විය. ඉතිරි භාණ්ඩ 668 ක වටිනාකම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මුද්‍රණ පාසලේ සුනාමියෙන් පසුව අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ තිබූ රු.5,242,880 ක්වූ උපකරණ 2 ක් 2014 වර්ෂය දක්වාම නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) ව්‍යාපෘතියකින් ලැබුණු රු.800,000 ක්වූ පුහුණු ද්‍රව්‍ය තොග පොත්වල සටහන් කිරීමකින් තොරව අනාරක්ෂිතව ගොඩගසා තිබුණි.

(ඉ) යාපනය දිස්ත්‍රික් කාර්යාලයේ පාඨමාලාවකට 2012 වර්ෂයේදී උපකරණ ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම පාඨමාලාව ආරම්භකර නොතිබූ අතර එම උපකරණ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඊ) 2013 දෙවන අර්ධ වර්ෂයේ රියදුරු පාඨමාලාව පවත්වා නොතිබුණු අතර බස් රථයක් හා වෑන් රථයක් නිෂ්ක්‍රීයව තිබුණි.

(උ) 2008 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද තෙමහල් ගොඩනැගිල්ලේ 2009 වර්ෂයේ එක් මහලක් ඉදිකර භාවිතයට ගෙන තිබුණද ඉතිරි ඉදිකිරීම් 2013 දෙසැම්බර් මාසය වන විටත් ආරම්භ කර නොතිබූ අතර කොන්ක්‍රීට් තට්ටුව නිරාවරණයවී තිබීම හේතුවෙන් මල බැදී දිරාපත් වන තත්ත්වයට පත්වී තිබුණි.

(ඌ) රත්මලාන ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු උපකරණ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පැස්සුම් ශිල්පී පාඨමාලා පන්ති කාමරයේ පුටු 35 කට අධික ප්‍රමාණයක් හා උපකරණ 05 ක්, ගුවන් විදුලි හා රූපවාහිනී ආශ්‍රිත උපකරණ අලුත්වැඩියා පාඨමාලා පන්ති කාමරය අසල කුඩා යකඩ කබඩ් 78 ක්, පන්ති කාමරය තුළ උපකරණ 26 ක්, මෝටර් කාර්මික පාඨමාලාවේ භාවිතයට ගත නොහැකි උපකරණ 14 ක්, වඩුකාර්මික පාඨමාලාවේ අලුත්වැඩියා කළ යුතු උපකරණ 10 ක්, යන්ත්‍රණ අංශයේ උපකරණ 05 ක්, අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් නොගෙන දීර්ඝ කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව පැවතුණි. මෙම තත්ත්වය 2012 තොග සමීක්ෂණයේදී අනාවරණය කර ගෙන නොතිබුණි.

(ii) ජාතික නිපුණතා සුදුසුකම් 4 වන මට්ටමේ පැස්සුම් ශිල්පී පාඨමාලාවට අවශ්‍ය නොවන උපකරණ 04 ක්, මෝටර් කාර්මික පාඨමාලාවේ උපකරණ 17 ක් හා කාමර දෙකක පාඨමාලා 02 කට අදාල උපකරණ නිෂ්ක්‍රියව පැවතිණි.

(iii) උද්‍යාන අලංකරණ පාඨමාලාවට අවශ්‍ය උපකරණ 22 ක්, යන්ත්‍ර ශිල්පී පාඨමාලාවට අවශ්‍ය උපකරණ 16 කට අදාල ඒකක 30 ක්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) පාඨමාලාවට අවශ්‍ය උපකරණ 12 ක්, වඩු කාර්මික අංශයට කම්ප්‍රෙෂර් (Compressor) එකක්, කර්මාන්ත උපකරණ ශිල්පී පාඨමාලාවට අවශ්‍ය විවිධ උපකරණ 318 ක් හා සැලසුම් ශිල්පී පාඨමාලාවට අවශ්‍ය උපකරණ 107 ක් අවශ්‍ය වී තිබුණ ද, 2014 අප්‍රේල් වන විට ද ලබාදී නොතිබුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ව්‍යාපෘති සඳහා ලබාදී තිබුණු රු.13,269,017 ක මුදල් ලබාගත් කාර්යයන්වල නොයොදා නිෂ්කාර්යව පැවතුණි.

## 4.6 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වාහන සඳහා බලපත්‍ර ලබා ගැනීමේදී නියමිත දිනට ලබා නොගැනීම නිසා රු. 128,858 ක් දඩ ලෙස ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) හාල්දඩුවන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ රු.29,500 ක භාණ්ඩ හානි වී තිබුණද ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) අධිකාරියේ ප්‍රධාන ගබඩාවේ ටයර්, ටියුබ්,බැටරි වැනි වාහනවලට අදාල භාණ්ඩ පිළිබඳ භෞතික තොග පරීක්ෂාවේදී බින්කාඩ්වල සඳහන් වටිනාකම රු.163,848 ක් වූ භාණ්ඩ අයිතම 06 ක ඌනතාවයක් විය.

## 4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2003 ජුනි 02 දිනැති පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 යන වගන්තිවල විධි විධාන පිළිබඳව සැලැකිල්ලක් නොදක්වා අධිකාරියේ සේවකයන් 22 දෙනෙකු අමාත්‍යාංශයට හා වෙනත් බාහිර ආයතනවලට මුදාහැර තිබුණි. එසේම සේවකයන් 18 දෙනෙකුගේ වැටුප්, දීමනා හා අතිකාල අධිකාරිය විසින් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා රු.5,091,982 ක් වූ අතර පසුගිය වර්ෂවල රු.10,835,399 ක් ගෙවා තිබුණි.

(ආ) උපදේශකයන් 07 දෙනෙකු මුදාහැර තිබුණු අතර ඔවුන්ගේ පත්වීම් ලිපිවල සඳහන් කොන්දේසි අනුව කටයුතු කර නොතිබුණි. සමහර උපදේශකයන් බඳවාගත් දින සිට වර්ෂ 17 ක් ඉක්මවූ කාලයක් වෙනත් රාජ්‍ය ආයතනවලට මුදාහල අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) එක් සේවකයකු 2013 සැප්තැම්බර් 09 දින අධිකාරියේ සේවයට වාර්තා කර තිබුණද නැවත 2013 ඔක්තෝබර් 07 දින සිට වෙනත් ආයතනයකට මුදාහැර තිබුණි. මුදාහල තවත් සේවකයන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේ අතිකාල වශයෙන් පිළිවෙලින් රු.251,165 ක් හා 182,069 ක් අධිකාරියෙන් ගෙවා තිබුණි.

(ඈ) වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේදී වැටුප් රු.99,167 ක් අඩුවෙන් ප්‍රතිපූර්ණය කර තිබුණු අතර මුදාහළ ආයතනයෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කළයුතු වුවත්, එම මුදල් කපාහැර තිබුණද අයවිය යුතු ශේෂ කපා හැරීමට අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය (භාණ්ඩාගාර අනුමැතිය) අනුව කටයුතු කර නොතිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත කාර්ය මණ්ඩලය 2,256 ක් වූ අතර හා තථ්‍ය කාර්ය මණ්ඩලය 1,775 ක් විය. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 481 ක් විය.

**(ආ) ඉඩම් පවරා ගැනීමේ කටයුතු සඳහා නිලධාරියෙකු අවිධිමත් ලෙස පත් කිරීම.**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉල්ලුම්පත්‍ර කැඳවීමකින් තොරව අවුරුදු 68 ක් ඉක්මවූ විශ්‍රාමික නිලධාරියෙකු 2013 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙර දාතම කර 2013 මාර්තු 18 දින පත්වීම් ලබාදී තිබූ අතර මේ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, මාස 04 ක සේවා කාලය සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන තිබුණි.

(ii) අමාත්‍යාංශයේ නියෝග අනුව 2013 අප්‍රේල් 30 දින වන විට සේවා කාලය අවසන් වුවද, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2014 සැප්තැම්බර් දක්වා සේවය කර තිබූ අතර,2007 මැයි 11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රු.30,000 ක දීමනාව රු.50,000 දක්වා අතීතයට බලපාන පරිදි වැඩිකර තිබුණි.

(iii) සේවයට වාර්තා කිරීම පිළිබඳ වාර්තා නඩත්තු කර නොතිබූ අතර මෙම නිලධාරියා බඳවාගත් කාර්යය වන ඉඩම් පවරා ගැනීම් කටයුතුවල ප්‍රමාණාත්මක ප්‍රගතියක් ඉටුවී නොතිබුණි.

**(ඇ) විමර්ශන නිලධාරි තනතුර සඳහා පැවරුම් රාජකාරී මත නිලධාරියෙකු බඳවා ගැනීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉල්ලුම්පත්‍ර කැඳවීමෙන් තොරව අවුරුදු 62 ඉක්මවූ විශ්‍රාමික නිලධාරියෙකු 2012 වර්ෂයේ සිට වාර්තාවේ දින දක්වාම මාස 03 න් තුනට පත්වීම් ලබාදී තිබූ අතර, මේ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. නිත්‍ය තනතුරට බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) අධ්‍යක්ෂ (පාලන) විසින් ලිඛිතව කාර්යය පැවරුම් ලබාදිය යුතු වුවත්, එලෙස සිදුකර නොතිබුණු අතර සෑම මාසයක් අවසානයේදීම කාර්ය ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එලෙස සිදුකර නොතිබුණි.

(iii) සභාපතිවරයාගේ අංක ADM/ASS/INV/18/2012-1 හා 2014 අප්‍රේල් 25 දිනැති ලිපිය මගින් 2014 පෙබරවාරි 11 දින සිට 2014 අප්‍රේල් 30 දින දක්වා පෙර දාතම කර සේවය දීර්ඝ කර තිබුණි.

(iv) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 168/3 මගින් විමර්ශන නිලධාරියාගේ සේවය 2014 අප්‍රේල් 30 දින තෙක් හෝ බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු බඳවා ගන්නා තෙක් යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් දීර්ඝ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණද එලෙස සිදු නොකර තවදුරටත් සේවයේ රඳවාගෙන තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ලද සේවකයන් 04 දෙනෙකුට රු.160,000 ක් වැය කර පුහුණුව ලබාදී තිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම සහ එහි ක්‍රියාකාරීත්වය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු අතර 5.1.3 වගන්තියේ විධි විධාන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම, වාර්ෂික අයවැය සමඟ මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතුය. සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර තිබුණේ 2013 වර්ෂයේදීය. එහෙත් 2013 හා ඉන් ඉදිරියට බලපැවැත්වෙන ආකාරයට සකස් කරන ලද සංයුක්ත සැලැස්මේ කාර්යයන් 2013 ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් වලට ඇතුළත් කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන සැලැස්ම වර්ෂය ආරම්භවීමට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඊට එකඟතාවය ලබාගෙන නොතිබුණු අතර පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණේ 2013 අප්‍රේල් 30 දින දීය. ඉකුත් වර්ෂයේ ඉලක්ක සිදු කිරීමට නොහැකි වූ වැඩසටහන් ඊළඟ වර්ෂයේ විගණන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු අතර කොන්ත්‍රාත් හා පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 204,459,721 ක මුදලක් වැය කර තිබුණද එම අංශ අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛණමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව නියමිත කාලය තුළ අනුමත කිරීමට කටයුතු කර නොතිබු අතර අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත ආදායම්, වියදම් හා තථ්‍ය ආදායම්, වියදම් අයිතම 16 ක සියයට 8 සිට සියයට 633 ක පරාසයක විචලනයන් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ගිණුම්කරණය
(ඇ) වාහන පාලනය
(ඈ) කාර්යය මණ්ඩල කළමනාකරණය
(ඉ) තොග පාලනය
(ඊ) ආධුනිකයන් පුහුණු කිරීම